සලාතය සඳහා ඇරයුම් කරනු ලබන විට ෂෙය්තාන් පසුපස හැරී පළා යනු ඇත.

අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. "සලාතය සඳහා ඇරයුම් කරනු ලබන විට ෂෙය්තාන් පසුපස හැරී පළා දුවනු ඇත. අදාන් පැවසීම තමන්ට නොඇසෙන තරමට වාතය පිටකරයි. ඇරයුම අවසන් කරනු ලැබූ විට ඉදිරියට එයි. සලාතයේ කුතුහලය ඇති කරන තරමට පැමිණ පසුපසට පළා යයි. එසේ කුතුහලය ඇතිකිරීම අවසන් වූ විට නැවත ඉදිරියට පැමිණ මිනිසා හා ඔහුගේ සිත අතර වැරදි ඇති කරමින් "මීට පෙර නොසිතූ
දෑ ගැන ඔබ මෙසේ සිතන්න මෙසේ සිතන්න." යැයි පවසයි. අවසානයේ මිනිසා සලාතයේ කෙතරම් රකආත් ගණනයක් ඉටු කළේ දැයි නොදන්නා තරමට පත් වෙයි. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

මුඅද්දින් අදාන් පවසන විට ෂෙයිතාන් පසුපස හැරී දුවනු ඇත. අදාන් කියන තැනින් තමන්ට අදාන් නොඇසෙන තරමට දුරස්ව යනු ඇත. අදාන් නොඇසෙන තරමට ඔහු වාතය පිටකරනු ඇත. එය අඥානයින් ඉන් වැළකී සිටින්නට කටයුතු කරන්නාක් මුඅද්දින්ගේ හඬට සවන් දීමෙන් බැහැරවන පරිදි තම හඬ ක්රියාත්මක කරමිනි. ඔහු ඒ ගැන උවමනාවෙන් කටයුතු කරයි. හේතුව එම හඬට සවන් දීමෙන් යමක් තමන්ට සිදුවනු ඇතැයි යන දැඩි බිය ඔහු තුළ ඇතිවීමය. එමෙන්ම සලාතයට අදාළ වන පිරිසිදුකමින් බැහැරකරවන කරුණු පිළිබඳවද කුතුහලය ඇති කිරීමට ඉදිරියට පැමිණෙයි. “ඇරයුම අවසන් කරනු ලැබූ විට ඉදිරියට එයි. සලාතයේ කුතුහලය ඇති කරන තරමට පැමිණ පසුපසට පළා යයි. එසේ කුතුහලය ඇතිකිරීම අවසන් වූ විට නැවත ඉදිරියට පැමිණෙයි“ එහි අර්ථය සැකය ඇති කිරීමයි. එහි මූලපදයෙහි අර්ථය: ඔටුවා ඌ දඟළන විට උගේ දරුණුකම හේතුවෙන් උගේ ගාත් දෙකට පහර දීමය. ඌ ආදම්ගේ පුතණුවන්ට සීමාව ඉක්මවා යන තරමට කටයුතු කරයි. අදාන් පවසන විට ෂෙයිතාන් පළා යනුයේ තව්හීද්හි ප්රකාශය හා අනෙකුත් ප්රතිපත්තීන් පිළිබඳ දන්වා සිටින විටය. එමෙන්ම දහමේ සංකේතයන් ස්ථාපිත කරන විට හා අල්ලාහ්ව මෙනෙහි කිරීම සවන් දීමට පිළිකුල් කරන විටය. එය අල් කුර්ආන් 114 වැනි පරිච්ඡේදයේ සඳහන් “සැගවී සිට කුතුහලයන් ඇති කරන්නාගේ හානියෙන්“ යන ප්රකාශයෙන් අර්ථවත් වේ. අල්ලාහ්ව මෙනෙහි කරන විට ඔහු කුකුස ඇති කරයි. පසුව සැගවී ගොස් දුරස ඇති කරයි. එය පුද්ගලයා හා ඔහුගේ සිත අතරය. සලාතයේදී මිනිසා අතර හා ඔහුගේ සිත අතර මැදිහත් වී මෙසේ මෙනෙහි කරන්න මෙසේ මෙනෙහි කරන්න මෙසේ මෙනෙහි කරන්න යැයි පවසයි. ඊට පෙර කිසිවක් මෙනෙහි කරන්නෙකු ලෙස ඔහු සිටියේ නැත. එනම් සලාතයේ නිරතවන්නට පෙර කිසිවක් නොසිතුවේය. මිනිසා මුළා වන තෙක් ඔහු එසේ සිදුකරයි. එනම් ඔහුට අමතකවී ඔහුගේ අවධානය වෙනතකට යොමු කරයි. තමන් කොතරම් රකආත් ගණනාවක් ඉටු කළේ දැයි තමන් නොදන්නා තරමට පත් වෙයි. සලාතයේදී ඔහු පැමිණෙනුයේ කුර්ආනය පාරායනය කිරීමත් සමගය. හේතුව බොහෝ වේලාවට නිහඬ වී අල්ලාහ් සමග සම්බන්ධවන අවස්ථාව එය වන බැවිනි. එය විනාශ කර දමන්නටත් එය ඉටු කරන්නාගේ බැතිමත් බව පළුදු කරන්නටත් විවිධ මාර්ග භාවිත කරයි. අබූ සඊද් තුමාගේ හදීසය පරිදි එසේ ඔහු අදාන් කියන අවස්ථාවේ පළා යනුයේ මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ආදම්ගේ පුතණුවන්ට සාක්ෂිදැරීමට තමන් බලකරනු නොලබන්නට යැයි ප්රකාශ වී ඇත. බලන්න: දලීලුල් ෆාලිහීන් (6/390) රියාලුස් සාලිහීන්හි විවරණය (5/34 හා ඉන් පසු එන හදීස්)


النجاة الخيرية
ALNAJAT CHARITY
لجنة الدعوة الإلكترونية
EDC E-Da'wah Committee